**වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීය ණය සංවර්ධන අරමුදලින් ලැබී තිබුණු හා ලැබිය යුතු රු.14,315,000 ක මුදල ආදායම් වියදම් ගිණුමට බැර කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදිව ගිණුම් ගත කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | පොල්ගහවිල අගලිය ආදාහනාගාරය ඉදිකිරීමට අදාළ කර්මාන්ත ණයගැති ශේෂය රු.9,903,901 ක් හා ආදාහනාගාරයේ දහන කුටිය ඉදිකිරීමේ කර්මාන්තයට අදාළ කර්මාන්ත ණයහිමි සහ කර්මාන්ත ණයගැති ශේෂය රු.30,000 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. | ඉදිරියේ දී නිවැරදිව ගිණුම් ගත කරන බව. | -එම- |
| (ඇ) | ඇත්කඳුර සුසාන භූමියේ අලුතින් වැට ඉදිකිරීම් වෙනුවෙන් දරා තිබුණු රු.277,640 ක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදිව ගිණුම් ගත කරන බව. | -එම- |
| (ඈ) | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.106,249 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | ඉදිරියේ දී නිවැරදිව ගිණුම් ගත කරන බව. | -එම- |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයකට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු.222,343 ක වෙනසක් පැවතිණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | | |
| | රීති 212 | අවස්ථා 19 ක දී මිලදී ගෙන තිබුණු එකතුව රු.1,151,424 ක් වූ තොග මිලදී ගැනීම් තොග ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. | නිසි ක්‍රමවේදයකට තොග ලේඛන නඩත්තු කිරීමට කටයුතු කරන බව. | තොග ලේඛනය යාවත්කාලීන කළ යුතුය. |
| (ආ) | දකුණු පළාත්, පළාත් සභා මූල්‍ය හා පරිපාලන රීති 476 හා 477 | සෑම වර්ෂයක් සඳහාම වාහන හා යන්ත්‍රෝපකරණ සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදු කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී කටයුතු කරන බව. | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව වාහන සමීක්ෂණයක් කළ යුතුය. |

### 1.7.2 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ දී දිනකට නිවස හා කාර්යාලය අතර ගමන් කිරීම සඳහා ලේකම්වරයා විසින් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් රහිතව සභාවේ වාහනය භාවිතා කර තිබුණු අතර, ඉන්ධන වෙනුවෙන් රු.295,547 ක් ගෙවීම් කර තිබුණි. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් මත තීරණය කරන බව. | පිරිවැය අවම වන පරිදි වාහනය භාවිතා කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.4,820,954 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,467,585 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බදු | 663,000 | 812,853 | 821,629 | 24,068 | 538,000 | 737,976 | 742,858 | 32,844 |
| කුලී | 343,200 | 129,540 | 140,680 | (1,400) | 468,200 | 170,505 | 182,065 | 9,740 |
| බලපත්‍ර ගාස්තු | 86,200 | 329,259 | 329,259 | - | 100,200 | 100,403 | 100,403 | - |
| වෙනත් ආදායම් | 2,058,500 | 6,112,507 | 6,100,679 | 113,723 | 1,829,500 | 3,951,037 | 3,904,742 | 101,895 |
| | 3,150,900 | 7,384,159 | 7,392,247 | 136,391 | 2,935,900 | 4,959,921 | 4,930,068 | 144,479 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය සඳහා වරිපනම් බද්දක් පනවා ගැනීමට සභාවට නොහැකි වී තිබුණි. | වරිපනම් බදු පැනවීම සඳහා මේ වන විට සිදු කරමින් පවතී. | දියුණු කළ ප්‍රදේශ සඳහා වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.741,714 ක් වූ පොත් 1915 ක් පවතින හින්පන්විල පුස්තකාලය සතියට දින දෙකක් පමණක් විවෘත කර තිබීම නිසා ප්‍රාදේශීය සභාවෙන් මහජනයා වෙත සපයන සේවාව සීමා වීමක් සිදු වී තිබුණි. | දින 05 ම යෙදවිය හැකි නිලධාරිනියක නොමැති බව. | මහජනයා වෙත උපරිම ලෙස සේවාවන් සැපයීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වටිනාකම රු.724,649 ක් වූ ගබඩා භාණ්ඩ අයිතම 29 ක ඌණතාවයක් ද, රු.64,540 ක වටිනාකමැති අයිතම 11 ක අතිරික්තයක් පැවතුණි. | නිසි ක්‍රමවේදයන්ට අනුව ගබඩා තොග පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | ගබඩා භාණ්ඩ මිලදී ගැනීම් කාලීනව ලේඛනගත කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ දී මිලදී ගත් වටිනාකම රු.49,000 ක් වූ ටෝනර් 02 ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයෙන් ගබඩාවේ පැවති අතර, ඒවා යෙදිය හැකි මුද්‍රණ යන්ත්‍රයක් ද සභාව සතුව නොතිබුණි. | ටෝනර් 02 භාවිතයට ගැනීමට හැකි බව. | අවශ්‍යතාවය හඳුනා ගෙන මිලදී ගැනීම් සිදු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අක්කර 12 රූඩ් 02 පර්චස් 39.8 ක් වූ රු.4,813,752 ක් වටිනාකමැති ඉඩම් 15 ක අයිතිය සභාව සතු නොවීය. | ඉදිරියේ දී පවරා ගැනීමට කටයුතු කරන බව. | ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදාහනාගාරයට ප්‍රවේශ වන මාර්ගයේ තාර යොදා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ දී නියමිත මිල අනුපාත භාවිතා නොකිරීම නිසා රු.47,219 ක් වැඩිපුර ගෙවා තිබුණි. | රේටයක් හඳුන්වා නොදීම නිසා මෙම ගැටළුකාරී තත්ත්වය පැන නැගී ඇති බව. | නියමිත මිල අනුපාත භාවිතා කළ යුතුය |
| (ආ) | වතුගහ ඉන්ද්‍රසේන ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ක්‍රීඩාපිටිය ඉදිකිරීමේ දී නියමිත මිල අනුපාත භාවිතා නොකිරීම නිසා රු.101,430 ක් වැඩිපුර ගෙවා තිබුණි. | DR-009 රේටය යන්ත්‍ර මගින් සිදු කරනවා ද, මිනිස් ශ්‍රමයෙන් සිදු කරනවාද යන්න කිසිදු සඳහනක් නොමැති බව. | -එම- |
| (ඇ) | බැකෝලෝඩරය යොදා ගනිමින් ක්‍රීඩාපිටිය පස් කැපීම සිදුකර තිබුණ ද, මිනිස් ශ්‍රමයෙන් පස් කැපීම සඳහා හඳුන්වා දී තිබුණු රු.1,242 ක මිල අනුපාත භාවිතා කිරීම නිසා රු.193,077 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | භාවිතා කළ යුත්තේ කුමන රේටයන් දැයි සම්බන්ධයෙන් දැනුවත් වීමක් හෝ උපදෙසක් කිසිදු ආකාරයකින් ලබා දී නොතිබුණු බව. | -එම- |